# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. }

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018.05.02.

පැමිණිලිකරු : ඩී.එම්.එන්.පී. දිසානායක මිය.
නො. 10. මල් මාවත.
කොළඹ 07.

වගඋත්තරකරුවන් : 1. විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

2. සුනිල් හෙට්ටිආරච්චි මහතා.
ලේකම්.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

3. ජයන්ත වික්‍රමනායක මහතා.
ජාතික පාසල් අධ්‍යක්ෂ.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : HRC/403/17</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකාරිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින්, තම දරුවා වන මිහෙල දුල්වත් දිසානායක යන අය 2017 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු වන ශ්‍රේණියට ඇතුළත් කිරීම සඳහා ආසන්නතා සතය යටතේ අයදුම්පත් ඉදිරිපත් කළ බවත්, RC/S/17/6605 දරණ යොමු අංකය යටතේ සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලකුණු



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office } 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson } 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax } 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail } sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone } 94-11-2505580/81/82
ලේකම් / செயலாளர் / Secretary } 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline } 011-2505575 1996
වෙබ් / இணையம் / Web } www.hrcsl.lk

79 ක් ලබාගෙන තිබූ බවත්. ඒ අනුව රාජකීය විද්‍යාලයේ 1 - F ශ්‍රේණියට දරුවා ඇතුලත් කර තිබියදී අධ්‍යාපන අමාත්‍යංශය විසින් විමර්ශනයක් පවත්වන බව පවසා දරුවා පාසල් නොඑවන ලෙස දැන්වූ බවත්. එතැන් සිට මේ දක්වා පාසලට ඇතුලත් කර ගෙන නොමැති බවත් ප්‍රකාශ කර ඇත. අධ්‍යාපන අමාත්‍යංශය මගින් සිදුකරන ලද විමර්ශනයේදී පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුලත් කිරීමට සුදුසු බවට නිර්දේශ කර ඇතත්. මේ දක්වා ඇතුලත් කර නොමැති බවද පැමිණිල්ලෙන් ප්‍රකාශ කර ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

මෙම පැමිණිල්ලට අදාළ පරීක්ෂණ කටයුතු සඳහා අධ්‍යාපන අමාත්‍යංශය හා රාජකීය විද්‍යාලයේ විදුහල්පතිවරයා වෙනුවෙන් නියෝජිතයෙකු ඉදිරිපත් වී කරුණු ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර ඇත්තේ ආසන්නතා සනය යටතේ මෙම පැමිණිලිකරුගේ දරුවා විද්‍යාලයට ඇතුලත් කිරීමට අදාළ සුදුසුකම් සපුරමින් ලකුණු 79 ලබාගෙන ඇති බවත්. ඒ අනුව පාසලට ඇතුලත් කිරීමට කටයුතු කළ බවත්ය. අධ්‍යාපන අමාත්‍යංශය විසින් පවත්වන ලද විමර්ශනයන් අනුව පැමිණිලිකරුගේ දරුවා ඇතුළු තවත් දරුවන් සංඛ්‍යාවක් පාසලට ඇතුලත් නොකරන ලෙසට අමාත්‍යංශය විසින් කරන ලද දැනුම්දීම අනුව දරුවා පාසැලට ඇතුලත් කර නොමැති බවද සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යංශය විසින් සිදුකරන ලද විමර්ශන වාර්තාව අනුව පැමිණිලිකරු අයදුම්පත් යොමු කර ඇති ලිපිනයට ඡන්දය ලියාපදිංචි වී ඇත්තේ 2014 සහ 2015 වසර වලට පමණක් බැවින් ඡන්දය සඳහා ලබාදෙන ලකුණු 28 න් 14 ක් අඩු කළ බවත්. ඒ අනුව පැමිණිලිකාරියට ලකුණු 65 ක් දක්වා ලකුණු අඩු කළ බවත් ප්‍රකාශ කර ඇත.

අමාත්‍යංශයෙන් පවත්වන ලද විමර්ශනයේ ප්‍රතිඵලයක් ලෙස පාසලට ආසන්න සනය යටතේ දරුවන් දෙදෙනෙකුද විද්‍යාලයට ඇතුලත් විය යුතු බවට නිගමනය කර ඇති අතර. පැමිණිලිකාරියගේ දරුවා වන එම්.ඩී. දිසානායක දරුවාට අසාධාරණයක් සිදුවී ඇති බවත්. පාසලට ඇතුලත් විය යුතු දරුවෙකු බවත් නිගමනය කර ඇත.

මානව හිමිකම් කොමිෂන් සභා විමර්ශනයේදී නිරීක්ෂණය වූ කරුණු :-

මෙම පැමිණිලිකාරියගේ දරුවා 2017 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුලත් කිරීම සඳහා අයදුම්පත් යොමු කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණයට භාජනය කර ලකුණු 79 ක් ලබාදී විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට සුදුසුකම් සපුරා ඇති බවට තීරණය කර විද්‍යාලයට ඇතුලත් කර තිබියදී දරුවා පාසලට ඇතුලත් නොකරන ලෙසට නැවත අමාත්‍යංශය විසින් තීරණයක් ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

අමාත්‍යාංශය විසින් මෙම පැමිණිල්ලට අදාලව 2017 වසරේ රාජකීය විද්‍යාලයේ 1 වන ශ්‍රේණියට ඇතුලත් කිරීම පිලිබඳව විමර්ශන කටයුතු සිදුකර ඇති අතර, පැමිණිලිකරුගේ දරුවාට ලකුණු 79 ක් මුලින් ලබාදී අමාත්‍යාංශය විසින් සිදුකරන ලද විමර්ශනයේදී ජන්දය සඳහා ලකුණු 14 ක් අඩු කොට ලකුණු 65 ක් මුළු ලකුණු සංඛ්‍යාව අඩු වී කර ඇති බවද නිරීක්ෂණය වේ.

ජන්දය සඳහා අඩු කරන ලද ලකුණු 14 පිළිබඳ පරීක්ෂා කිරීමේදී පාසලින් ලකුණු ලබාදීමේදී 2011 සහ 2012 වර්ෂ සඳහා ජන්දය ලියාපදිංචි වී ඇත්තේ අයදුම් කරන ලද ලිපිනයට නොවන බව නිරීක්ෂණය වී ඇත. පැමිණිලිකාරිය අයදුම්පතෙහි එම තොරතුරු නිවැරදිව සඳහන් කර ඇත. චක්‍රලේඛන ප්‍රකාරව අදාළ කාල සීමාව තුළ ලිපිනයන් දෙකක ජන්දය ලියාපදිංචි වී ඇති අවස්ථාවකදී පෙර පදිංචි ස්ථානයට ජන්දය සඳහා ලකුණු හිමිවන්නේ ආසන්න පාසල් සඳහා ලබාදෙන ලකුණු ප්‍රමාණයේ වෙනසක් සිදු නොවන්නේ නම් පමණි. නමුත් විද්‍යාලය විසින් ඒ පිළිබඳව අවධානය යොමු වී ඇති බවට නිරීක්ෂණය නොවේ. එම ලකුණු 14 අඩු කිරීමෙන් පසුවද පැමිණිලිකරුට ලකුණු 65 ක් හිමිවන අතර, පාසලට ඇතුලත් කරගෙන ඇති කඩඉම් ලකුණු සීමාව ලකුණු 58 කි.

ඒ අනුව පැමිණිලිකාරියගේ දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ පළවන ශ්‍රේණියට ඇතුලත් කිරීමට සුදුසුකම් සපුරා ඇති බව නිරීක්ෂණය වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයෙන් සිදුකරන ලද විමර්ශනයේ වාර්තාව අනුව ද පැමිණිලිකාරියගේ දරුවා විද්‍යාලයට ඇතුලත් විය යුතු බවට නිගමනය කර ඇති බව නිරීක්ෂණය වේ.

නිගමනය :-

ඉහත කරුණු සියල්ල සලකා බැලීමෙන් අනතුරුව ප්‍රමාණවත් ලකුණු ලබාගෙන තිබියදීත් වගඋත්තරකරුවන් විසින් පැමිණිලිකාරියගේ දරුවා මේ වනතෙක් කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කර නොතිබීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

පැමිණිලිකාරියගේ දරුවා වන එම්.ඩී. දිසානායක දරුවා කොළඹ රාජකීය විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට (2018 වර්ෂයේ 2 වන ශ්‍රේණියට) ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.

2018.06 .02 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට හෝ එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
නො 14, ආර්.ඒ. ද මෙල් මාවත,
කොළඹ 04.

පිටපත :- ලේකම්.
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය. බත්තරමුල්ල.

B/